# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,590 – 2009 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා – 2009.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (II අ) වැනි ඡෙදය - පළකිරීම්

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු - අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.
02. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.
03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.
04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.
05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.
06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.
07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 මාර්තු මස 20 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජනවාරි මස 22 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අනුරාධපුරය | කැකිරාව | කලාගම් පළාත කොට්ඨාසයේ තිබ්බටුවැව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය. |

02-358

---

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.
02. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.
03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.
04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.
05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.
06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.
07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 පෙබරවාරි මස 20 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 පෙබරවාරි මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | නෙලුව | මාවනාන කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ හිනිදුම් පත්තුව කොට්ටාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| ගාල්ල | යක්කලමුල්ල | කොට්ටව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ තල්පෙ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |
| ගාල්ල | බෝපෙ-පෝද්දල | ලබුදූව කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ ගාල්ල කඩවත් සතර කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

02-515

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2009 මාර්තු

1991.05.17 වැනි දින හා අංක 662/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිළධාරීන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 07 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරීන් ස්ථිර කිරීමට පෙර සමත්විය යුතු වන දෙපාර්තමේන්තු විභාගය 2009 මාර්තු මස 29 වැනි දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා කාල සටහන ප්‍රවේශපත්‍රයේ සඳහන් කරනු ඇත.

02. *සුදුසුකම්.-*

මෙම විභාගයට අයදුම් කළ හැක්කේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරීන් හා දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරීන්ගෙන් මෙතෙක් අදාල විභාගය සම්පූර්ණ කර නොමැති නිළධාරීන්ට පමණි.

03. *අයදුම්පත් .-*

මෙම චක්‍රලේඛයේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, සුවසිරිපාය ගොඩනැගිල්ලේ අධ්‍යක්ෂ (විභාග) වෙත 2009.03.08 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව කොට්ඨාස ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග ලිපිනය ලියන ලද රු. 30.00ක් වටිනා මුද්දර ඇලවූ 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක්ද එවිය යුතුය. (මෙහි කැමති පරිදි රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලිවිය හැකිය) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. *විභාග ගාස්තු .-*

i. විභාගයට පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25 බැගින් අවලංගු නොකල මුද්දර ඉල්ලුම් පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළ යුතුය.

ii. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

05. *විභාගයට ඇතුළත් කර ගැනීම.-*

i. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත්කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

ii. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය :

(අ) පුද්ගල හැඳුනුම්පත්‍රය,
(ආ) දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත්‍රය,
(ඇ) රියදුරු බලපත්‍රය,
(ඈ) ගමන් බලපත්‍රය.

iii. කිසියම් නොවැලැක්විය හැකි හේතුවක් මත විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුනේ නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පරීක්ෂාකර මධ්‍යස්ථානය සහ විභාග අංකය සොයාගත හැකිය. එසේ ඔබේ නමට අදාල විභාග අංකය සහ විභාග මධ්‍යස්ථානය සොයාගත්තේ නම් ඔබේ ආසන්නතම ජ්‍යෙෂ්ඨ නිළධාරියා වෙතින් අත්සන සහතික කරන ලද ලිපියක්ද සමග වෙබ් අඩවියේ සඳහන්ව තිබූ විභාග මධ්‍යස්ථානයට පැමිණ ඔබේ අනන්‍යතාවය තහවුරු කර විභාගයට පෙනී සිටිය හැකිය. (වෙබ් අඩවිය -www.health.gov.lk)

06. *විභාග පරිපාටිය.-*

මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයකින් සමන්විතය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50ක් ලබාගත යුතුය. එක් වරකදී හෝ කිහිප වරකදී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිළධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ අදාල සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය.

07. *විභාග නිර්දේශ මාලාව : -*

07:1 ලිඛිත විභාගය

07:1:1 ආයතන සංග්‍රහය.-

කාලය පැය 02 යි. ප්‍රශ්න 08කින් ප්‍රශ්න 05කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

*විෂය නිර්දේශය*

(i) ආයතන සංග්‍රහය :

*(අ)* පළමු වැනි කොටස - II, III, V, VI, VIII, IX, XI, XII, XIII, XV, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද

*(ආ)* දෙවැනි කොටස - XLVII සහ XLVIII වැනි පරිච්ඡේද

(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රෙගුලාසි

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සංයුතිය හා කාර්යභාරය

7.1.2 *රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය .-* කාලය පැය 1 1/2 යි. ප්‍රශ්න 07කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතු ය. මුළු ලකුණු 100 කි.

*විෂය නිර්දේශය :*

*සෞඛ්‍ය සේවා සංග්‍රහය :*

(i) වැනි කොටස - වෛද්‍ය සේවා

(ii) වැනි කොටස - රසායනාගාර සේවා

7.1.3 *ගිණුම් .-* කාලය පැය 02යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04කට පිළිතුරු සැපයිය යුතුය. මුළු ලකුණු 100 කි.

*විෂය නිර්දේශය*

(i) *මුදල් රෙගුලාසි - 1 වැනි කොටස :*

පරිච්ඡේද I - සියලුම වගන්ති

II - සියලුම වගන්ති

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 පෙබරවාරි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 පෙබරවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

III - සියලුම වගන්ති
IV - සියලුම වගන්ති
V - 1, 2, 3, 4 සහ 6 වගන්ති
VI - සියලුම වගන්ති
VII - 1, 2, 3, 4 සහ 6 වගන්ති

(ii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගබඩා ගිණුම් තැබීම පිළිබඳ රෙගුලාසි
(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහයේ මුදල් පිළිබඳ ඡේදයන්
(iv) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියෙකුගේ දෛනික රාජකාරිවලට අදාළ වන මුදල් රෙගුලාසි.

7.2 *සිංහල/දෙමළ වාචික පරීක්ෂණය*

සිංහල/දෙමළ භාෂා ප්‍රවීණතාවය මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් විසින් කොළඹදී පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. මුළු ලකුණු 100 කි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේදී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහලෙන් හෝ දෙමළෙන් සාකච්ඡා කිරීමට නිලධාරින්ට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

08. කරුණාකර මෙම චක්‍රලේඛයේ අඩංගු දෑ ඔබ කොට්ඨාසයේ/විශේෂිත ව්‍යාපාරයේ/ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරින්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත.

09. 2008 සැප්තැම්බර් විභාගයට අදාළ ප්‍රතිඵල ඉක්මනින් නිකුත් කරන බව කරුණාවෙන් සලකන්න.

වෛද්‍ය යූ. ඒ. අජිත් මෙන්ඩිස්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්,
සෞඛ්‍ය ලේකම් වෙනුවට.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය,
'සුවසිරිපාය',
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
2009 ජනවාරි මස 30 වැනි දින.

කාර්යාලීය ප්‍රයෝජන සඳහා පමණි

**ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන දෙපාර්තමේන්තු විභාගය - 2009 මාර්තු**

01. *(අ)* i. අයැදුම්කරුගේ නම (සිංහලෙන් හෝ දෙමළෙන්, මුලකුරු අගට යොදා ලියන්න) :————.
ii. අයැදුම්කරුගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්, මුලකුරු අගට යොදා ලියන්න) :————.
iii. මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.
iv. මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

*(ආ)* i. නිල නාමය (වෛද්‍ය නිලධාරී/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී) :————.
ii. සීමාවාසික පත්වීම ලද දිනය :————.
iii. ප්‍රාථමික ශ්‍රේණියට පත්වීම ලද දිනය :————.

02. ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ ( ✓) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

ආයතන සංග්‍රහය ☐ රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ☐
ගිණුම් ☐ සිංහල වාචික ☐ දෙමළ වාචික ☐

03. *(අ)* දැන් සේවය කරන ආයතන :————.
*(ආ)* එය අයත් දිස්ත්‍රික්කය :————.
*(ඇ)* ඔබට විභාගයට පෙනී සිටීමට හැකි ආසන්නතම හෙද විදුහල :————.
*(ඈ)* පහත දක්වා ඇති මධ්‍යස්ථාන අතුරින් විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානයට අදාළ කොටුවේ හරි ලකුණ යොදන්න (දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති නම් හෝ, දක්වා ඇති මධ්‍යස්ථාන එකක් හෝ කිහිපයක් අවලංගු කරනු ලබන අතර, එකී මධ්‍යස්ථානයට අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් ආසන්නතම විභාග මධ්‍යස්ථානයකට හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලබන වෙනත් විභාග මධ්‍යස්ථානයකට අනුයුක්ත කරනු ලැබේ.).

| | | | | | |
|---|---|---|---|---|---|
| කොළඹ | | කඳාන | | මුල්ලේරියාව | |
| කළුතර | | ගාල්ල | | බදුල්ල | |
| කුරුණෑගල | | අනුරාධපුරය | | රත්නපුරය | |
| මහනුවර | | මඩකලපුව | | යාපනය | |
| අම්පාර | | | | | |

*(ඈ)* විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9" x 4" ප්‍රමාණයේ රු. 30.00 ක මුද්දර ඇලවූ ලියුම් කවරයක් අයැදුම්පත්‍රයට අමුණන ලද්දේ ද?:————.
*(ඉ)* 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) :————.
2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) :————.
05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? :————.
(ආ) ප්‍රථම වතාවට නොවේ නම් මුද්දර අලවා තිබේද? :————.

මුද්දර කොටුව

06. *අයැදුම්කරුගේ සහතිකය :*
මගේ දැනුම හා විශ්වාසය පරිදි,
(i) මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ප්‍රථම වතාවට නොවන බැවින් රු. ...................... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්, මෙම ඉල්ලුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.
(ii) සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳව ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

:————.
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

..............................................................................මහතා/මිය/මෙනවිය* මෙම ආයතනයේ සේවයේ නියුතු වෛද්‍ය නිලධාරියෙකු වන අතර, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට/ප්‍රථම වතාවට නොවන* බවටද රු......... ක් වටිනා මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අලවා ඇති බවද/මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද, මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

:————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :————.

**විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර* ප්‍රධානියාගේ සහතිකය**

..............................................................................මහතා/මිය/මෙනවිය* වෛද්‍ය නිලධාරියෙකු/දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු * වශයෙන් මගේ කොට්ඨාසයේ/ව්‍යාපාරයේ * සේවය කරන බවත්, අයැදුම්පතේ දී තිබෙන තොරතුරු අයැදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————.
විමධ්‍යගත කොට්ඨාස/විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන
(මුද්‍රාව තැබිය යුතුය)

දිනය :————.
(*අනවශ්‍ය කොටස් කපා හරින්න.)

02-383

---

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

### දැන්වීම

ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඒ. පී. තාඹුගල මහතා විසින් ලියා සහතික කරන ලද අංක 10817 සහ වර්ෂ 2008.11.26 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් එහි ඇටෝර්නි අධිපති ගණේමුල්ල, පහළ යාගොඩ, මාහේනවත්ත අංක 4/4 හි පදිංචි තන්ත්‍රිගේ ගීත් තිළින පැතුම් පීරිස් විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ රුග්ගහවිල, උඩුගොඩ අංක 09 පදිංචි විල්වර ආරච්චිගේ සුමතිපාල වන මා ඇටෝර්නි බලකරු ලෙස පත් කර ඇති අතර, එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර බලරහිත කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තන්ත්‍රිගේ ගීත් තිළින පැතුම් පීරිස්.

02-510

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : මයික්‍රෝ ටෙලිකොම් සොලුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 66892
ලියාපදිංචි දිනය : 2009.01.28
ලියාපදිංචි කළ කාර්යාලයේ ලිපිනය : අංක 170/3, මොරටු පාර, සුවාරපොළ, පිළියන්දල.

සමාගම් ලේකම්වරු,
කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම.

02-507

### දැන්වීම

2007 අංක 07 සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම 2009.01.09 දින ලියාපදිංචි කර ඇත.
සමාගමේ නම : ඇගේප් ලංකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි අංකය : පී. වී. 66752
ලියාපදිංචි ලිපිනය : අංක 35, හොරකැටිය, කුඩා උඩුව, හොරණ

සමාගම් ලේකම්.

02-508

### සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ අංක 07 දරන ඡේදය අනුව මහජනයා වෙත කරන නිවේදනය.
සමාගමේ නම : ලෙෂර් කාගෝ කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 66564
ලියාපදිංචි ලිපිනය : අංක 260, ශ්‍රී රාමනාදන් මාවත, කොළඹ 15.

අධ්‍යක්ෂවරු.

02-428

### ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.
සමාගමේ නම : සයිනෙක්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 66817
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 24 ඒ, මල්වත්ත මාවත, කොහුවල, නුගේගොඩ.

සමාගම් ලේකම්.

02-471

### දැනුම් දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් නාමය සහ අංකය යටතේ විස්තර කරනු ලබන සමාගම සංස්ථාගත කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නාමය : නියොන් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 66162
සංස්ථාගත දිනය : 2008 නොවැම්බර් මස 13 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 40/10 ඒ, 1 වන පටුමග, සෝමාතලගල මාවත, පැගිරිවත්ත පාර, දෙල්කඳ, නුගේගොඩ.

සමාගම් අධ්‍යක්ෂක.

02- 455

### දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 කොටස ප්‍රකාරව සී. ඩී. එෆ්. සී. සී. ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම, 2009 ජනවාරි මස 08 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ඇකියුට් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් සිය සමාගම් නාමය වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ කලින් තිබූ නම : ඩී. එෆ්. සී. සී. ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වි. 3310
ලියාපදිංචි කාර්යාලය : අංක 216, ද සේරම් පාර, කොළඹ 10
සමාගමේ අලුත් නාමය : ඇකියුට් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

මණ්ඩලයේ අණ පරිදි,
කෝපරේට් සර්විසස් ලිමිටඩ්,
ලේකම්වරු.

ඇකියුට් ස්ටොක් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

02-482

### දැන්වීම

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9 ඡේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : සීමාසහිත සිලෝන් ටී බුෂ් (පුද්.)
සමාගමේ අංකය : පී. වී. 66923
ලියාපදිංචි කාර්යාලය : අංක 95/16, රාජගිරිය පාර, රාජගිරිය
සංස්ථාගත කළ දිනය : 2009 ජනවාරි මස 30 වැනි දින.

සමාගම් ලේකම්වරු,
කෝර්පරේට් ඇඩ්වයිසර් සර්විසස් (පුද්) සමාගම.

02-484

### 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.
සමාගමේ නම : මැක්ලරන්ස් ෂිපිං ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 66843
සංස්ථාපනය කළ දිනය : 2009.01.22
ලියාපදිංචි ලිපිනය : අංක 284, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
මැක්ලරන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-422/1

### 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.
සමාගමේ නම : මැක්ලරන්ස් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 66799
සංස්ථාපනය කළ දිනය : 2009.01.16
ලියාපදිංචි ලිපිනය : අංක 284, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
මැක්ලරන්ස් හෝල්ඩින්ග්ස් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-422/2

### දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගතකළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ
සමාගමේ නම : බැම් ස්මයිල්ස් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 66481,
දිනය - 2008 දෙසැම්බර් මස 11
ලියාපදිංචි කාර්යාලය : අංක 25, සර් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගමේ,
ලේකම්වරු.

02-385/1

### දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගතකළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : නවාරා කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 66661,
දිනය : 2008 දෙසැම්බර් මස 31 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 400/60/7, ලන්ඩන් ඇවනිව්, කොළඹ 7.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගමේ,
ලේකම්වරු.

02-385/2

### දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගතකළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.
සමාගමේ නම : නවාරා ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 66662,
දිනය : 2008 දෙසැම්බර් මස 31 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 400/60/7, ලන්ඩන් ඇවනිව්, කොළඹ 7.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගමේ,
ලේකම්වරු.

02-385/3

### දැන්වීම

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 09 වැනි ඡේදයට අනුව පහත සඳහන් සමාගම සංස්ථා ගතකළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ
සමාගමේ නම : මෙගා ටෙන් බයෝඑනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය සහ සංස්ථාගත කළ දිනය : පී. වී. 65901,
දිනය : 2008 ඔක්තෝබර් මස 17 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 620, කෝට්ටේ පාර, රාජගිරිය.

නෙක්සියා කෝපරේට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගමේ,
ලේකම්වරු.

02-385/4

### දැන්වීම

පහත සඳහන් සමාගම වර්ෂ 2008 දෙසැම්බර් මස එකළොස් වැනි දින සංස්ථා ගත කරන ලද බව වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය අනුව කරනු ලබන දැන්වීමයි.
සමාගමේ නම : විචී කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පි. වී. 66470
සමාගමේ ලිපිනය : අංක 107 නාගරික සංවර්ධන අධිකාරියේ කර්මාන්ත පුරය, කටුවාන, හෝමාගම.

එන්. හේවා කණ්ඩම්බි,
නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්,
සමාගමේ ලේකම්.

02-406

### ඇටෝර්නි බලය අවලංගු කිරීම/ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බදුල්ල දිස්ත්‍රිකක්යේ, කටුවේගම, ඉදල්ගස්හින්න, හපුතලේ පදිංචි හිටිහාමි මුදියන්සේලාගේ රංජිත් ප්‍රේමදාස වන මම, බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් සංජීව නිශාන් විජේසේකර මහතා විසින් වර්ෂ 2008 ක් වූ සැප්තැම්බර් මස 27 වැනි දින සහතික කරන ලද අංක 176 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් එකී ශ්‍රී ලංකා ජනරජයේ බදුල්ල දිස්ත්‍රික්කයේ, කටුවේගම, ඉදල්ගස්හින්න, හපුතලේ පදිංචි හේවා විතාරණලාගේ කරුණාවතී නමැති අයට ලබාදුන් විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලැබූ බව ශ්‍රී ලංකා රජයත්, සියලු මහජනතාවනුත්, අන් සියලු දෙනාත් මෙයින් දැන ගනිත්වා.

එකී විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ පියවරවල් සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාරගනු නොලබන බවද, සියළු දෙනාම මෙයින් දැන ගනිත්වා.

හිටිහාමි මුදියන්සේලාගේ රංජිත් ප්‍රේමදාස.

02-408

### සමාගමක් සංස්ථාපිත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනය.

පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බව මෙයින් දැනුම් දෙමු :

| සමාගමේ නම | සමාගමේ අංකය | දාතම | සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය |
| --- | --- | --- | --- |
| අයි. සී එල් - රොබුස්ටා (පුද්ගලික) සමාගම | පී. වී.. 66801 | 2009.01.16 | අංක 69, ජයලත් බිල්ඩින්, 3 වන මහල, නව කැළණි පාලම පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය |
| ජී සී එම් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාගම | පී. වී. 66807 | 2009.01.19 | අංක 421, රාජගිරිය පාර, රාජගිරිය. |

සී/ස එකවුන්ටන්සි ඇන්ඩ් සෙක්‍රටේරියල් සර්විසස්
බියුරෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු,

2009 පෙබරවාරි මස 03 වැනි දින,
අංක 86, එස්. ද එස්. ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ.
02-445

## වෙන්දේසි කිරීම් දැන්වීම්

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්. සී
(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ මහර ප්‍රාදේශීය සභා සීමාවේ මහර උප කාර්යාල සීමාවේ මහර සූරියපාළුව ගමේ පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් මැන සාදන ලද අංක 4903 හා 2005.10.03 දින දරන පිඹුරේ 2006.01.10 දින දරන පිටසන අනුව බෙදා වෙන් කළ ලොට් 2 ඒ දරන බිම් කොටස.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 10.30.

(ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේ සමග.)

ඉහත කී බිම් කොටසට අංක 507 දරන (එස්. ඩී. චන්ද්‍රතිලක මිනින්දෝරු මහතා) පිඹුරේ ලොට් 5 ලෙස ලකුණු කරන ලද අඩි 10ක් පළල පාර මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමග වෙනත් ඊට සමාන අයිතිවාසිකම් පොදුවේ භාවිතා කිරීමත් සමග වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් විජේසිංහ මුදියන්සේලාගේ පූර්ණි ප්‍රහර්ෂිනි නිල්මි මහීපාල විසින් ලියා සහතික කරන ලද්දාවූ ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) නමට ලියන ලද්දා වූ ද අංක 79 සහ 2006 පෙබරවාරි මස 21 දිනැති උකස් බැඳුම්කරය ද, අංක 186 සහ 2006 ජුනි මස 28 දින දරන දෙවන උකස් බැඳුම්කරය ද අංක 368 සහ 2007 මාර්තු මස 15 වැනි දින දරන අතිරේක උකස් බැඳුම්කරය ද යන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම කැළණිය, හිඹුටුවැල්ගොඩ, අංක 706 දරන ස්ථානයේ පදිංචි වාසලතන්ත්‍රී මුදලිගේ ජයන්ත පෙරේරා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009 ක් වූ මාර්තු මස 12 වැනි දින පෙ. ව. 10.00 ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.01.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.12.30 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ, නුවර මාර්ගයේ කි. මී. 16 පමණ ගමන් කළ විට කඩවත හමුවේ. එතැනින් වමට හැරී ගණේමුල්ල පාරේ. කි. මී. 3 ගමන් කළ විට යුධ හමුදා කඳවුර පසු වීමට ප්‍රථම දකුණට ඇති සූරිගම පාරේ තවත් මීටර් 200ක් පමණ ගමන් කළ විට "T" හංදියක් හමුවේ, එතැන දකුණට හැරී මීටර් 100 පමණ ගමන් කර වමට ඇති ගුරු පාරේ තවත් මීටර් 75 ක් ගමන් කළ විට වරිපනම් අංක 234/ඒ දරන දේපළ පසුකර තවත් මීටර් 30ක් පමණ වම් පසින් ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.*-විකිණීම ස්ථිරකළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි :

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. කළමනාකරු - පාරිභෝගික නීති කටයුතු, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංක 0114-682403, 077-3918733

ත්‍රිවංක සහ සේනානායක,
වෙන්දේසිකරුවෝ, බලයලත් වෙන්දේසිකරුවෝ ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ,
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, තෙවන මහල,
හල්ස්ඩෝර්ෆ් පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංක 011- 2388318.
02-529

### නිවැරදි කිරීමයි
පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී

2009.01.23 වැනි දින අංක 1,586 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස II B ඡෙදයේ වෙන්දේසි කිරීම් යටතේ පළ වූ නිවේදනයේ "යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.01.03 වැනි දින ලක්බිම සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009.03.02 වැනි දින සුඩර් ඔලි පුවත්පත ද 2009.01.09 වැනි දින *ගැසට් පත* ද බලන්න." යන්න පහත ආකාරයට නිවැරදි විය යුතුය.

"යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.01.03 වැනි දින ලක්බිම සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009.01.02 වැනි දින සුඩර් ඔලි පුවත්පත ද, 2009.01.02 වැනි දින *ගැසට් පත* ද බලන්න."

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්එස්එම් ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
02-533

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.
(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (ගම්පහ ලියාපදිංචි කොට්ඨාසයේ) අලුත්කූරු කෝරළයේ රාගම් පත්තුවේ ජාඇල කඳාන ප්‍රාදේශීය සභාවේ කඳාන උප කාර්යාල සීමාව තුළ කඳානේ පිහිටි රාජමන්ත්‍රී ජයසූරිය පාරේ වරිපනම් අංක 27 දරන සහ අංක 609 සහ 1966.11.10 දින දරන මානක පිඹුරේ නිරූපිත 'මකුල්එගහ හෙවත් දෙල්ගහවත්තේ 1/6, පංගුව' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 16290 සහ 1999.01.08 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ඒ.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 13.69.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. රණසිංහ විසින් ලියා සහතික කරන ලද්දාවූ ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) නමට ලියන ලද්දාවූ ද, අංක 239 සහ 2004 අගෝස්තු මස 26 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම කොළඹ 04, ද ෆොන්සේකා පෙදෙස, අංක 14 දරන ස්ථානයේ පදිංචි රෝහිත කුමාර් ඔබේසේකර පෙරේරා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009ක් වූ මාර්තු මස 16 වැනි දින පෙ. ව. 10.00ට ඉහත සඳහන් දේපළ අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.12.26 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2008.12.16 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසීම.* - කඳානේ නගරයේ පල්ලිය පාරේ මීටර් 600ක් පමණ ගමන් කළ විට "Y" හංදියක් හමුවේ. එතැනින් දකුණට ඇති රාජමන්ත්‍රී ජයසූරිය පාරට (බෝපිටිය බස් පාරේ) හැරී තවත් මීටර් 100 පමණ ගමන් කළ විට අදාළ වරිපනම් අංක 27 දරන දේපළ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීම් කළ යුතු ආකාරය.*-විකිණීම ස්ථිර කළ වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි :

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය.
03. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
04. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
05. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්,
06. ලිපිකරු හා සෝෂක වේතන රු. 500,
07. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න : කළමනාකරු-පාරිභෝගික නීති කටයුතු, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී., අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංක : 0114-682403, 077-3918733.

ත්‍රිවංක සහ සේනානායක,
වෙන්දේසිකරුවෝ,බලයලත් වෙන්දේසිකරුවෝ ,
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණය සහ දිසා
අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ,
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, තෙවන මහල, හල්ස්ඩෝර්ෆ් පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2388318.
02-530

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ විකිණීම

2009.02.06 වැනි දින අංක 1,588 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ වෙන්දේසි දැන්වීමට අනුව 2009.02.27 දිනට පැවැත්වීමට නියමිතව තිබූ එකී උපලේඛනයේ සඳහන් වාද්දූව, මොල්ලිගොඩ පිහිටි කිරිපැල්ල ගහවත්ත සහ ගොඩපර ගහ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. එම්. ආර්. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 205 හා 1993.02.17 දිනැති පිඹුරේ ලොට් අංක 38 දරන දේපළට අදාළ වෙන්දේසියේ විකිණීම අවලංගු කරන ලද බව සියළු දෙනාගේ දැන ගැනීම පිණිස පළ කරමු.

සහකාර සාමාන්‍යාධිකාරී (ණය).

ණය අංශය,
ජාතික ඉතිරිකිරීමේ බැංකුව.

අංක 255, ගාලු පාර,
කොළඹ 03.
02-452

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/71353/වයි18/812.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.01.13 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2005.06.13 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.03.27 වැනි දින පස්වරු 3.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ආදායම් පාලක කාර්යාල සීමාව තුළ 73 කුඹුකේවැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයට අයත් නැටියගම පිහිටි කොහොඹගහමුලහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. බී. අබේරත්න විසින් සකසන ලද 2000.03.04 දිනැති හා අංක 2735 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 02, පර්. 2ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එල්. ඩී. ඕ. 01/323/20 හි ලියාපදිංචි වී ඇත.

තවද, ඉහත කී අංක 2735 දරන පිඹුරේ දැක්වෙන පාරක් සඳහා වෙන් කරන ලද බිම් කොටස මතින් හා හරහා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
02-456/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/64970/වයි18/568.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.08.27 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2004.12.18 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.03.27 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කදුරුගස්හේන පිහිටි ගොරොක්ගහමුලහේන සහ කදුරුගහමුලහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් සකසන ලද 1997.12.13 දිනැති හා අංක 5399 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 22.94 ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ජේ 13/224 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.
02-456/2

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේයූ 18/1227/කේයූ/725.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.12.19 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2008.12.22 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කුරුණෑගල, මල්කඩුවාව වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජේතිලක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.03.27 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගිරිඋල්ල ප්‍රාදේශීය සභා සීමාවේ දඹදෙනි හත්පත්තුවේ උඩුකහ නැගෙනහිර කෝරළයේ පැලවත්ත නමැති ගමෙහි පිහිටි රද්දරංපිටියවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් 2006.08.15 දින මැන සකසන ලද 34/2006 දරන පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 01, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එෆ් 1091/265 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.
02-456/3

### පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 මාර්තු මස 27 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කූරු කෝරළයේ දූනගහ පත්තුවේ කිඹුලාපිටිය පිහිටි දැනට එක් ඉඩමක් වන කදුරුගහවත්ත සහ දෙල්ගහවත්ත සහ කෝන්ගහවත්ත, කදුරුගහවත්ත, පාලුගහලන්ද, කිරිනුගගහවත්ත හෙවත් කදුරුගහවත්ත මූනමල්ගහවත්ත හෙවත් කුරුඳුගහවත්ත කදුරුගහවත්ත කැබැල්ල නමැති ඉඩම ට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස් පෙරේරා විසින් මැන සාදන ලද අංක 5610/1 සහ 2006.06.03 දින දරන සැලැස්මේ දක්වා ඇති ඉඩම. ප්‍රමාණය අ. 1, රූ. 3, පර්. 02.55 බිම් කැබලි සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ විසින් සහතික කරන ලද අංක 5747 සහ 2006 නොවැම්බර් මස 20 සහ අංක 5839 සහ 2007 මැයි 29 සහ අංක 5911 සහ 2007 දෙසැම්බර් 11 දින දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් කච්චකඩුගේ ප්‍රශාන්ත ඇන්ටන් ප්‍රනාන්දු උකස්කරු වශයෙන් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.02.19 වැනි දින ලක්බිම, සුඩර් ඔලි සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009.02.20 වැනි දින ගැසට් පත්ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- කිඹුලාපිටිය, දාගොන්න පාරේ කිඹුලාපිටිය රෝමානු කතෝලික පල්ලියේ සිට සැතපුම් 1/2ක් ගිය විට එම පල්ලිය අසලින් දකුණු පසට මෙම විකිණීමට ඇති ඉඩම පාරට මුහුණ ලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුලත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු, නීති - පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
02-451/1

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 මාර්තු මස 26 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :-

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළයේ රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොළුව උප කාර්යාල සීමාව තුළ දඹදුරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 8691 සහ 2005 සැප්තැම්බර් මස 06 දින දරන සැලැස්මේ බිම් කැබැල්ල.

ප්‍රමාණය : අ. 0, රූ. 1, පර්. 0.

එකී අංක 8691 දරන සැලැස්මේ දක්වා ඇති බෙදා සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ ද සහ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 199/104 හි ලියාපදිංචි කර ඇත.

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. පී. කුරේ විසින් සහතික කරන ලද අංක 5613 සහ 2006 ජනවාරි මස 17 සහ අංක 5701 සහ 2006 අගෝස්තු මස 01 සහ අංක 5977 සහ 2008 අප්‍රේල් මස 22 වැනි දින දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් වෙද සුරංග ද සිල්වා උකස්කරු වශයෙන් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.02.17 වැනි දින ලක්බිම, සුඩර් ඔලි සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009.02.20 වැනි දින ගැසට් පත්‍ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* . : දඹදුරේ පාලම අසලින් වමට හැරී උඩමිත්ත පාරේ ගිය විට කනත්ත මංසන්ධිය අසලින් වමට හැරී ගලේවත්ත පාරේ යාර 200ක් පමණ ගිය විට විකිණීමට ඇති ඉඩම දකුණු පස පාර අසල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.
02-451/2

---

**පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී**

1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ 2009 මාර්තු මස 26 වැනි දින ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල කොළඹ පාරේ පිහිටි දැනට කොළඹ පාරේ වරිපනම් අංක 190 දරන සුදුවීකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 16710 සහ 1999.11.30 දින දරන සැලැස්මේ ලොට් වයි බිම් කැබැල්ල කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුමේ/පත්ඉරු බී 864/42 හි ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 06.75

එකී අංක 1764 දරන සැලැස්මේ ලොට් 2 සහ 3 මත මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1364 සහ 2004 ජූලි මස 19 සහ අංක 2663 සහ 2007 ජූනි 14 දින දරන උකස්කරයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති හෙයින් හීතකේ ලැන්ට්‍රි කැමිල්ටන් සිල්වා උකස්කරු වශයෙන් උකස් කරන ලද දේපළ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.02.18 වැනි දින ලක්බිම, සුඩර් ඔලි සහ ඩේලි නිවුස් පුවත්පත් සහ 2009.02.20 වැනි දින ගැසට් පත්‍ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- මීගමුව පාරේ දකුණු පසට ඇති වත්තල පී. එල්. සී. පෑන් ඒෂියා බැංකුව අසල මෙම විකිණීමට ඇති ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද (සියයට දෙකහමාරක් පමණ),
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු නීති, පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී එල් සී, ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්.
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ. .
දුරකථන අංකය : 2863121.
02-451/3

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බදුල්ල ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් හරිතා රාජපක්ෂ විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, හි නමට ලියා සහතික කරන ලද්දා වූ 2007.01.21 දින හා අංක 653 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහමඩ් හමීම් මොහමඩ් රිස්වාන් යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ මාර්තු මස 09 වැනි දින පෙ. ව. 11.30 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ, අළුත්වෙලගමෙහි පිහිටි රත්වතී මාවත, වරිපනම් අංක 11/7 සී ට අයත් 'මහපෙතිරාජකුඹුර' සහ 'ගල්පොතේකුඹුර' නමැති ඉඩමට බලයලත් මානක එම්. එෆ්. ඉස්මයිල් විසින් මැන සාදන ලද 1985.03.25 දින අංක 2422 දරන ඉඩමේ ලොට් අංක '5'වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස වේ.

විශාලත්වය :- පර්චස් 20.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.11.28 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.12.16 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*පිවිසුම් මාර්ගය*.-බදුල්ල බස් නැවතුමේ සිට මහියංගනය පාරේ. කි. මී. 1 පසුකළ විට හමුවන කයිලගොඩ හන්දියෙන් වම් පසට තිබෙන බණ්ඩාරනායක මාවතෙහි මීටර් 100 පසු කළ විට හමුවන රත්වත්ත මාවත හන්දියෙන් දකුණට හැරී රත්වත්ත මාවත ඔස්සේ මීටර් 65 පමණ පසුකර වම්පසට ඇති විද්‍යාල පටුමගෙහි තවත් මීටර් 100 පසුකර වමට ඇති ප්‍රවේශ මාර්ගයෙහි මීටර් 35 ක් පමණ පසුකළ විට අදාළ ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංක : 2863121.
02-451/4

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මරදාන ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී හි නමට ලියා සහතික කරන ලද්දා වූ 2004.05.26 දින හා අංක 1620 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහමඩ් කලීල් මොහමඩ් රම්සි යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2009ක් වූ මාර්තු මස 12 වැනි දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවට අයත් මාකොළ උප කාර්යාලය තුළ හෙයියන්තුඩුව ගමේ, පිහිටි ගුණසේකර පාරේ වරිපනම් අංක 26/1 දරන 'නාගහලන්ද' නමින් හැඳින්වෙන ඉඩමට බලයලත් මානක එල්. එන්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද 2001.09.12 දිනැති අංක 1000 දරන පිඹුරේ ලොට් අංක "ඒ" වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටස වේ.

විශාලත්වයः පර්චස් 15

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2008.09.19 දින දරන *රජයේ ගැසට් පත්‍රය* හා 2008.11.06 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*පිවිසුම් මාර්ගය*.-නුවර පාරේ කිරිබත්ගොඩ, හන්දියෙන් දකුණු පැත්තට හැරී කිලෝමීටර් 4.7ක් පමණ බියගම දෙසට ගිය විට මයිනෙත්ති ලංකා පරිශ්‍රයේ ලඟින් සහ එහි ඉදිරිපස පිහිටි ටෙඩ්ස්ටාර් කර්මාන්ත ශාලාව ලඟින් දකුණට හැරී මීටර් 50ක් ගිය විට හමුවන සතර මංහන්දියේ මෙම දේපල ගුණසේකර පාරේ ඉදිරිපසට මුහුණ ලා පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කෙමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%)ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් වේ.

ගැණුම් මුදලින් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුලත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා අදාල ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ගෙන් ලබාගත හැක.

රංජිත එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්.
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ. .
දුරකථන අංක : 2863121.
02-451/5

---

**රුහුණ සංවර්ධන බැංකුව- මාවරල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම්

රුහුණ සංවර්ධන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය මත මෙහි පහත විස්තර වන දේපළ 2009.03.09 දින පෙ. ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උකස්කර ඇති දේපල පිළිබඳ විස්තර*.- දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩපත්තුවේ, දේවාලගම සහ වැවුලපියද්ද ගම් දෙකට අසුව පිහිටි ලාවල්ලහේන හෙවත් දෙල්ගහහේනේ අංක 01 දරන කැබැල්ලෙන් බෙදූ අංක 01ඒ දරන කැබැල්ල ද, පල්ලියෙකොන්දෙදෙනිය හෙවත් බයිසෙවැව කොරටුව ඉඩමෙන් බෙදා වෙන් කළ අංක 17 දරන පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල බිමේ වැව්ලි සහ ගොඩනැගිලි ද ලොට් අංක 50 දරන ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද වේ.

වැඩි විස්තර සඳහා 2008.10.24 දින *රජයේ ගැසට් පත්‍රය* ද 2008.12.03 දින දිනමිණ, තිනකරන් හා දි අයිලන්ඩ් යන පුවත්පත්වල ද පළ කර ඇති වෙන්දේසි යෝජනාවට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම*.-දෙයියන්දර, රදාවෙල මාර්ගයේ බොරළුපල හන්දියේ සිට වම්පසට වැටී ඇති මාර්ගයේ මීටර් 150ක් ගිය පසු හමුවන තුන්මන් හන්දියෙන් දකුණට වැටී ඇති කොන්ක්‍රීට් පාරේ පිහිටි පළමු ඉඩම වේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය තින්දු කළ විගස පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුයः-

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. පළාත් අධිකාරියේ බදු සඳහා විකුණුම් මිලෙන් 1%ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
04. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක් ද,
05. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
06. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත මාතර, පඹුරන, අනගාරික ධර්මපාල මාවතේ අංක 382ඒ, දරණ ස්ථානයේ පිහිටි රුහුණ සංවර්ධන බැංකුවේ, ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍යාධිකාරිතුමාට ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි දින 30ක් ඇතුළත අදාල මුදල නොගෙවුවහොත් දැනටමත් ගැණුම් මිලෙන් ගෙවා ඇති 25%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 041 2231532, 2226208, 2226209, 041-2282523

ජී. පී. ආනන්ද,
සාමවිනිසුරු, බලයලත් වෙන්දේසිකරු,
උසාවිකොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම,
මාතර.
දුරකථන අංකය : 041-2228731, 0714438516
02-435

---

**ජාතික ඉතිරි කිරීමේ බැංකුව**

පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උතුරු පිටිගල් කෝරළයේ ආනවිලුන්දන් පත්තුවේ නල්ලදරන්කටුව ගමේ පිහිටි රොමානිවත්ත නමැති ඉඩමේ රජයේ මිනුම්පති විසින් සකසන ලද 1993.09.02 දින බෙදා වෙන් කර සහතික කර සකසන ලද මුල් අංක පීයූ 3332 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 2.63ක් වූ බිම් කොටස. තවද, එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සහ එහි ඇති මාර්ග අයිතිය ද වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඞී 135/100 දරන පත්ඉරුව යටතේ ලියාදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.
02-456/4

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 1/38385/සීඩී4/709, එස්-1/49582/ඒඕ1/112, 1/53300/සීඩී9/551.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.10.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩී. බුද්ධදාස, පී. ඒ. සී. කේ. නියතපාල සහ එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 1999.07.14, 2006.05.05 සහ 2006.10.27 දිනයන් හා අංක 2510, 2980 සහ 946 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාලඹේ පදිංචි විතානගේ හෙම්දු ශ්‍රී සම්පත් පෙරේරා සහ ගම්ලස්සගේ අනුෂා නිල්මිණි කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ විසිතුන්දහස් පන්සිය හැත්තෑ හතරයි ශත අනූවක, රුපියල් අටලක්ෂ පනස්හය දහස් දෙසීය හැටහයයි ශත විසිහයක සහ රුපියල් හයලක්ෂ දහ දහස් දෙසීය අසූ හයයි ශත විසි නවයක (රු. 3,23,574.90, රු. 8,56,266.26 සහ රු. 6,10,286.29)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2510, 2980 සහ 946 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පනස් නවයයි ශත පනස් හත, රුපියල් තුන්සිය අසූ එකයි ශත විසිඑක සහ රුපියල් දෙසීය හැත්තෑ පහයි ශත අසූඅට (රු. 159.57, රු. 381.21 සහ රු. 275.88) බැගින් වැඩිපුර පොළීය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝකන්දර පිහිටි දඹුගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් 1996.11.03 වැනි දින මැන සකසන ලද අංක 5482 දරන පිඹුරේ කැබලි අංක සී ලෙස බෙදා වෙන්කර දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 10ක් වූ බිම් කොටස වේ.

මෙය හෝමාගම් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක ජී 1642/13හි ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මිනින්දෝරු එස්. ජෙගතීසන් විසින් 1961.06.23 වැනි දින සකසන ලද අංක 862 පිඹුරේ කැබලි අංක සී ලෙස බෙදා වෙන් කර ඇති බිම් කොටස මතින් පාර සඳහා වෙන් කර ඇති අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.
02-456/6

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001307.

ණයකරුගේ සම්පූර්ණ නම : ප්‍රභාත් අසංග සමන්සිරි රතුගමගේ
ඇටර්නි බලකාර විතාරනගේ උදුලා
පුෂ්පලතා රොඩ්රිගෝ.

ජා-ඇළ ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 1463 හා 2002.11.02 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් එකසිය හැත්තෑතුනයි ශත පනස් තුනක (රු. 3,67,173.53) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් පනස් දෙකයි ශත අසූ දෙකක (රු. 2,83,052.82) මුදල ද, වර්ෂ 2007.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූහතර දහස් එකසිය විස්සයි ශත හැත්තෑඑකයි (රු. 84,120.71) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් එකසිය හැත්තෑතුනයි ශත පනස් තුනක (රු. 3,67,173.53) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් පනස් දෙකයි ශත අසූ දෙකක (රු. 2,83,052.82) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.90% බැගින් වන පොළියක් 2007.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 02 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛන**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, බණ්ඩාරවත්ත ග්‍රාමයේ ස්කාගාර පාරේ, වරිපනම් අංක 89/2හි පිහිටි ගොඩකඳුරුගහවත්ත නමැති ඉඩමට 1993.08.24 දින ජේ. පී. අයි. අබේකෝන් මානක තැන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 473හි ලොට් 2බී ට මායිම්, උතුරට : පිඹුරු අංක 917/66හි ලොට් 1 දරන ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 917/66හි ලොට් 3 දරන ඉඩම ද, දකුණට : ලොට් 2ඒ ද, බටහිරට : ලොට් 2ඒ ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම දෙකයි පහක (අ. 0. රූ. 0, පර්. 8.25) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී864/10හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

02-504

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230000705 සහ 0233300209.

ණයකරුගේ සම්පූර්ණ නම : ලලිත් වසන්ත අතුකෝරළ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. පී. ගනේපොල විසින් ලියා සහතික කරන ලද අංක 2213, 4210 හා 1996.03.08, 1999.11.24 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අසූහයදහස් දෙසිය හැත්තෑ හතරයි ශත අසූහතක (රු. 1,86,274.87) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැටදහස් හාරසිය හැටදෙකයි ශත තිස්අටක (රු. 1,60,462.38) මුදල ද වර්ෂ 2005.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිපන්දහස් අටසිය දොළහයි ශත හතලිස් නවයක් (රු. 25,812.49) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අසූහයදහස් දෙසිය හැත්තෑ හතරයි ශත අසූහතක (රු. 1,86,274.87) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැටදහස් හාරසිය හැටදෙකයි ශත තිස්අටක (රු. 1,60,462.38) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%, 15.50% බැගින් වන පොලියක් 2005.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, අළුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ රද්දොළුව ග්‍රාමයෙහි පිහිටි මිගහවත්ත නමැති ඉඩමට 1995.09.19 වැනි දින කේ. ආර්. එස්. ෆොන්සේකා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1219බී පිඹුර ප්‍රකාර ලොට් 4ඒ2බීට මායිම්, උතුරට : පිඹුරු අංක 1219බීහි ලොට් 4ඒ2ඒ සහ ලොට් 4ඒ2සී ද, නැගෙනහිරට : බලයලත් මානක කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද පිඹුරු අංක 1190හි ලොට් 4සී ද, දකුණට : දෙපා ඇළ ද, බටහිරට : බලයලත් මානක කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද පිඹුරු අංක 1219හි ලොට් 4ඒ1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 125/208හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

02-501

---

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0233300274.

ණයකරුගේ සම්පූර්ණ නම : බියන්විලගේ ඔස්වල්ඩ් ට්‍රෙවෝ ශාමන්ත පෙරේරා.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් ලියා සහතික කරන ලද අංක 2464 හා 1996.08.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ නවසිය හැත්තෑ තුනයි ශත විසිඅටක (රු. 1,00,973.28) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ හයදහස් නවසිය අසූහතයි ශත තුනක (රු. 76,987.03) මුදල ද වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිතුන්දහස් නවසිය අසූහයයි ශත විසිපහක (රු. 23,986.25) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ නවසිය හැත්තෑ තුනයි ශත විසිඅටක (රු. 1,00,973.28) ද,

(2) එකී රුපියල් හැත්තෑ හයදහස් නවසිය අසූහතයි ශත තුනක (රු. 76,987.03) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%බැගින් වන පොලියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූ ල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 30 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියපත්තුවේ, අළුත්කුරු කෝරළේ, සීදුව කටුනායක නගර සභා සීමාවේ සීදුව වෝඩ් අංක 10 මිෂන් හවුස් පාරේ වරිපනම් අංක 24/9 පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට 1996.03.07 දින කේ. ඊ. ජේ. බී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 4400 පිඹුර ප්‍රකාර ලොට් 3බීට මායිම්, උතුරට සහ නැගෙනහිරට : බී. ජේ. ඩී. එන්. පොන්සේකාට අයිති කැබලි අංක 3ඒ ද, දකුණට : අඩි 12 පළල පාර ද, බටහිරට : කේ. එච්. ගුණදාසට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.48) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 741/178හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරි.

02-503

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1803300468.

ණයකරුගේ සම්පූර්ණ නම : සරත්තිලක සමරසිංහ ආරච්චිලාගේ තුෂාර ඉන්දික විජේරත්න.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සී. එම්. සී. බෝගොල්ලාගම විසින් ලියා සහතික කරන ලද අංක 15990 හා 1996.09.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූනමදහස් අටසිය හතලිස්හතයි ශත පහළොවක (රු. 99,847.15) මුදලක් වර්ෂ 2004.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑඅටදහස් හයසිය හතලිස්දෙකයි ශත හැත්තෑහයක (රු. 78,642.76) මුදල ද වර්ෂ 2004.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඑක්දහස් දෙසිය හතරයි ශත තිස්නමයක් (රු. 21,204.39) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූනමදහස් අටසිය හතලිස්හතයි ශත පහළොවක් (රු. 99,847.15) ද,

(2) එකී රුපියල් හැත්තෑඅටදහස් හයසිය හතලිස්දෙකයි ශත හැත්තෑහයක (රු. 78,642.76) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%බැගින් වන පොලියක් 2005.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලෑල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 21 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, රෙකෝපත්තු කෝරළේ, පඹේ සහ වීදුරු වැල්ල ග්‍රාමයන්හි පිහිටි පිදුරුවැල්ල එස්ටේට් නමැති ඉඩමට 1995.09.30 වැනි දින සරත් වෙලගෙදර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3512 පිඹුර ප්‍රකාර ලොට් 41ට මායිම්, ඊසානට : ලොට් 42 ද, ගිණිකොණට : ලොට් 13 ද, නිරිතට : ලොට් 40 ද, වයඹට : ලොට් 52 ද යන මායිම් තුල පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ f 1076/230හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-502

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

කච්චකඩුගේ ප්‍රශාන්ත ඇන්ටන් ප්‍රනාන්දු විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්ෆ්‍රි කුරේ විසින් සහතික කරන ලද අංක 5747 සහ 2006 නොවැම්බර් මස 20, අංක 5839 සහ 2007 මැයි මස 29 සහ අංක 5911 සහ 2007 දෙසැම්බර් මස 11 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 සැප්තැම්බර් මස 05 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අසූනම ලක්ෂ දහසය දහස් පන්සිය හැත්තෑ දෙකයි ශත අසූ එක (රු. 89,16,572.81)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් විසිහතර ලක්ෂ පනස් දහස (රු. 24,50,000) ක් සහ රුපියල් විසිහතර ලක්ෂ අනූඑක් දහස් හතලිස් හතයි ශත හැට (රු. 24,91,047.60)ක මුදල මත 2008 සැප්තැම්බර් මස 06 වැනි දින සිට වර්ෂයකට 29% බැගින් පොලිය ද, රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සියය තිස් හතරයි ශත හැත්තෑව (රු. 35,75,334.70)ක මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට 38% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 5747, 5839 සහ 5911 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් අසූනම ලක්ෂ දහසය දහස් පන්සියය හැත්තෑ දෙකයි ශත අසූඑක (රු. 89,16,572.81) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කිඹුලාපිටිය පිහිටි දැනට එක් ඉඩමක් වන කදුරුගහවත්ත සහ දෙල්ගහවත්ත සහ කෝන්ගහවත්ත කදුරුගහවත්ත පාලුගහලන්ද, කිරිනුගගහවත්ත හෙවත් කදුරුගහවත්ත මූලමල්ගහවත්ත හෙවත් කදුරුගහවත්ත, කදුරුගහවත්තේකැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. නන්දන සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 423 සහ 1988 ජූලි මස 19 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : මීගමුව සිට අලුත්පොල දක්වා වූ මහා මාර්ගය, නැගෙනහිරට : එම්. මෝසස් පෙරේරාගේ ඉඩම සහ එම්. මාර්ටින් පෙරේරාට සහ අනෙක් අයට අයත් ඉඩම්, දකුණට : විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත සහ බස්නාහිරට : සිසිලි මේරි ග්‍රේස්ගේ ඉඩම යන මායිම් තුළ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් එකයි දශම නමයයි තුන (අ. 1, රූ. 3, පර්. 1.93)ක් විශාල එකී අංක 423 දරන සැලැස්මේ ලොට් 3 සහ 4 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එකිනෙකට යාබද බිම් කැබැලි සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද වේ.

නුදුරු යලි මැනුමක් අනුව එකී යාබද ලොට් 3 සහ 4 යන ඉඩම් පහත දැක්වෙන අයුරින් විස්තර කෙරේ :

ඉහත කී කිඹුලාපිටිය පිහිටි දැනට එක් ඉඩමක් වන කඳුරුගහවත්ත සහ දෙල්ගහවත්ත සහ කෝන්ගහවත්ත කදුරුගහවත්ත, පාලුගහලන්ද කිරිනුගගහවත්ත හෙවත් කදුරුගහවත්ත, මූනමල්ගහවත්ත හෙවත් කදුරුගහවත්ත, කදුරුගහවත්තේකැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 5610/1 සහ 2006.06.03 දින දරන සැලැස්ම පරිදි, උතුරට : පාර (අධිවේගී මාර්ගය), නැගෙනහිරට : එම්. ගෝර්ති පෙරේරාගේ ඉඩම සහ විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත, දකුණට : විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත සහ බස්නාහිරට : සිසිලි මේරි ග්‍රේස්ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දෙකයි දශම පහයි පහක් (අ. 1, රූ. 3, පර්. 2.55)ක් විශාල එකී සැලැස්මේ දැක්වෙන බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,

ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/4

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

පැලියගොඩගේ නිශාන්ත ජූඩ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1417 සහ 2004 සැප්තැම්බර් මස 16 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 23 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ අසූනම දහස් පනස් තුනයි ශත තිස් දෙක (රු. 4,89,053.32)ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් හාරලක්ෂ හැටතුන් දහසක (රු. 4,63,000) ක මුදල මත 2008 නොවැම්බර් මස 24 වැනි දින සිට වර්ෂයකට 27% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 1417 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හාරලක්ෂ අසූනම දහස් පනස් තුනයි ශත තිස් දෙක (රු. 4,89,053.32) ක මුදල සහ 2008 නොවැම්බර් මස 24 වැනි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

#### උපලේඛණය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දකුණ, රාගම් පත්තුවේ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ තෙලඟපාත පිහිටි (බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 6209 සහ 1981.09.20 වැනි දිනැති සැලැස්මේ ලොට් සී දරන බිම් කැබැල්ලේ කොටසක් වන) තෙලඟපාත පාරේ වරිපනම් අංක 103/9 දරන පොකුණබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 1420 සහ 1991.09.26 දරන සැලැස්ම පරිදි, උතුරට : පාර (අංක 6209 සැලැස්මේ ලොට් ඊ), නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : පාර සහ බස්නාහිරට : අංක 6209 දරන සැලැස්මේ ලොට් ඩී දරන ඉඩම් කැබැල්ල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 7.50)ක් හෝ හෙක්ටයාර් 0.0190ක් විශාල එකී අංක 1420 සැලැස්මේ ලොට් 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියල්ල ද වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 719/102 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,

ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/3

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

වෙද සුරංග ද සිල්වා විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ජී. කුරේ විසින් සහතික කරන ලද අංක 5613 සහ 2006 ජනවාරි 17, අංක 5701 සහ 2006 අගෝස්තු 01 සහ අංක 5977 සහ 2008 අප්‍රේල් 22 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 10 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් තිස්එක් ලක්ෂ හැටඅට දහස් නමසිය හැත්තෑ තුනයි ශත හතලිහ (රු. 31,68,973.40)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දහනම ලක්ෂ තිස්නම දහස් පන්සීය හැත්තෑ නමයයි ශත දහහත (රු. 19,39,579.17) ක මුදල මත 2008 නොවැම්බර් මස 11 වැනි දින සිට වර්ෂයකට 26% බැගින් පොලිය ද, රුපියල් දසලක්ෂ අනූ අට දහස් හත්සිය තුනයි ශත අනූ හතරක (රු. 10,98,703.94) මුදල මත 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට 38% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 5613, 5701 සහ 5977 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් තිස්එක් ලක්ෂ හැටඅට දහස් නමසීය හැත්තෑ තුනයි ශත හතලිහ (රු. 31,68,973.40) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474, මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

#### උපලේඛණය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොළුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2902 සහ 1974 ජූනි මස 11 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : එකී සැලැස්මේ ලොට් 36, නැගෙනහිරට : යූ. සිල්වාගේ ඉඩම, දකුණට : එකී සැලැස්මේ ලොට් 39 සහ 38 සහ බස්නාහිරට : එකී සැලැස්මේ ලොට් 31 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල එකී අංක 2902 දරන සැලැස්මේ ලොට් 37 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේද වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොලුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට ඉහත කී අංක 2902 සහ 1974 ජූනි මස 11 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : එකී සැලැස්මේ ලොට් 37 ද. නැගෙනහිරට : එකී සැලැස්මේ ලොට් 39, දකුණට : එකී සැලැස්මේ ලොට් 44 සහ බස්නාහිරට : එකි සැලැස්මේ ලොට් 31 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල එකී අංක 2902 දරන සැලැස්මේ ලොට් 38 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේද වේ.

ඉහත කී ලොට් 37 සහ 38 යන බිම් කැබලි දෙක බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 2005 සැප්තැම්බර් මස 06 වැනි දිනැති අංක 8691 දරන සැලැස්මෙන් ඒකාබද්ධ කරන ලද අතර පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොලුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 8691 සහ 2005 සැප්තැම්බර් මස 06 දිනැති සැලැස්ම පරිදි උතුරට : නිමල් නෝනිස්ට හිමි එකී ඉඩමේ ලොට් 36, නැගෙනහිරට : ගාමිනීට අයිති ඉඩම සහ පත්මාවතීට අයත් එකී ඉඩමේ ලොට් 39, දකුණට : පත්මාවතීට අයත් එකී ඉඩමේ ලොට් 39 සහ බස්නාහිරට : එකී ඉඩමේ ලොට් 31 (දැනට ප්‍රාදේශීය සභා පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 20) විශාල එකී අංක 8691 දරන සැලැස්මේ දක්වා ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ සහ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී199/104හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,

ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/2

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්-

හීතකේ ලැන්ට් කැමිල්ටන් සිල්වා විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1364 සහ 2004 ජූලි 19 සහ අංක 2663 සහ 2007 ජූනි 14 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ විසිපන් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතලිස් නමය (රු. 5,25,374.49)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2008 නොවැම්බර් මස 03 වැනි දින සිට රුපියල් හාරලක්ෂ දහනම දහස් දෙසීය දෙකයි ශත හැටදෙක (රු. 4,19,202.62) ක මුදල මත වර්ෂයකට 30% බැගින් පොලිය ද, රුපියල් පස් අටදහස් තුන්සිය තිස්තුනයි ශත හතලිස් අට (රු. 58,333.48) ක මුදල මත වර්ෂයකට 28% බැගින් පොළිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 1364 සහ 2363 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් පන්ලක්ෂ විසිපන් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතලිස් නමය (රු. 5,25,374.49) ක මුදල සහ 2008 නොවැම්බර් මස 03 වැනි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474, මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

#### උපලේඛණය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල කොළඹ පාරේ පිහිටි දැනට කොළඹ පාරේ වරිපනම් අංක 190 දරන සුදුවීකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 16170 සහ 1999.11.30 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 1764 සහ 1993 අප්‍රේල් 07 දිනැති සැලැස්මේ ලොට් 3 (අඩි 12ක් පළල පාර) සහ ඉහත කී අංක 16710 සැලැස්මේ ලොට් ‘X’ දරන ඉඩම් කැබැල්ල, නැගෙනහිරට : ඉහත කී අංක 16710 සැලැස්මේ ලොට් ‘X’ දරන ඉඩම් කැබැල්ල, දකුණට : දැනට හැටන් නැෂනල් බැංකුව සතු මෙම ඉඩමේම තවත් කොටසක් සහ බස්නාහිරට : මීගමුව සිට කොළඹ දක්වා වූ මහා මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 6.75)ක් හෝ හෙක්ටයාර් 0.0171ක් විශාල එකී අංක 16710 දරන සැලැස්මේ ලොට් ‘Y’ බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 864/42 වෙලුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1764 දරන සැලැස්මේ ලොට් 2 සහ 3 මත මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,

ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/1

---

### සෙලාන් බැංකුව පීඑල්සී - වැලිමඩ ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 09 යටතේ ලියාපදිංචි කර ඇත.)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0570-01161702-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.06 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ

විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 09 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සුහයිරා fපලීක් විසින් තුනම සහතික කරන ලද 2004 මැයි 03 දිනැති අංක 271, 2004 මැයි 03 දිනැති අංක 272 සහ 2005 පෙබරවාරි 22 දිනැති අංක 355 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම කැප්පෙටිපොළ පදිංචි වීරසේකර මුදියන්සේලාගේ රූපසිංහ සහ මාපා මුදියන්සේලාගේ හිමාලි එරංගිකා යාපා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් නවලක්ෂ හතලිස්එක්දහස් අටසිය තිස්අටයි ශත හතලිස්හතක (රු. 9,41,838.47) මුදලක්, 2007 අගෝස්තු මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 9,41,838.47 මුදල ද, 2007 අගෝස්තු මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 271, 272 සහ 355 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලයත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩ පළාත කෝරළේ, උඩුකිඳ පාළුගම පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. රූපසිංහ විසින් සාදන ලද 1996.12.11 දිනැති අංක 5 දරන සැලැස්ම අනුව ගොඩමුනේ කුඹුර වත්ත නමැති ඉඩමේ නොබෙදූ බාග (1/2) කොටසට මායිම්, උතුරට : නුවරඑළිය දිසාවට ප්‍රධාන පාර ද, නැගෙනහිරට : දෙවට පාර ද, දකුණට : අගල සහ බස්නාහිරට : නුවරඑළිය දිසාවට පාර සහ වැටිය යන මායිම් තුළ රූඩ් තුනයි, පර්චස් තිස්පහයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 35.5) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 410/895 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 2000.02.04 දිනැති අංක 1842ඒ දරන සැලැස්මේ ලොට් 4 ලෙස පෙන්නුම් කරනු ලබන සහ පෙර කී පාළුගම පිහිටි ගොඩමුනේ කුඹුරේ වත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට : කන්දේ ඇල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ආර්. එල්. ලෙනෝරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම හා බස්නාහිරට : ලොට් 3 යන මායිම් තුළ පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරි-නීති.

02-509

---

### හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී.- බලංගොඩ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.05.17 දින සහ අංක 127 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, නිකලන්ද වත්ත ප්‍රේමතිලක සහ නිකලන්ද වත්ත පියල් උදයකුමාර ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ හැත්තෑහත්දහස් හත්සිය අසූපහයි ශත හැත්තෑහය (රු. 6,77,785.76) ක මුදලක් 2008.06.30 දින වන විට හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,77,785.76 ක මුදලට 2008.07.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 127 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, උඩ පත්තුවේ, බලංගොඩ සුළු නගර සභා සීමාව තුළ වතුකරගොඩ ගමෙහි පිහිටි වරිපනම් අංක 34/6ඒ වන "කරවුකෙටිය වත්ත-උස් බිම" නමැති ඉඩමට බලයලත් මානක එම්. සමරසේකර විසින් මැන සාදන ලද අංක 5582 සහ 1999 අප්‍රේල් මස 20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද 'ලොට් 18' ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 11න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 3හි මාර්ග පරවශතා අයිතියෙන් ද, දකුණට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 19ඒ වලින් ද සහ බස්නාහිරට : එම ඉඩමේම කොටසකින් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩමට අයත් ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 287/163 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

02-506

---

### නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාර (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ධනුෂ්කි ලියනපටබැඳි විසින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. පූර්ණි ප්‍රභාර්ශිණි නිල්මි මහීපාල විසින් පිළිවෙලින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කර වශයෙන් හඳුන්වනු ලබන) පිළිවෙලින් අංක 203 සහ 2005 ජූනි මස 28 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ අංක 200 සහ 2006 ජූලි මස 17 දින ද දරන ද්විතීයික බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) බොරලැස්ගමුව දිවුලපිටිය, පන්සල පාරේ, අංක 56/1 දරන ස්ථානයේ පදිංචි අමරදිවාකර ආරච්චිගේ දොන් සුසන්ත විජේතුංග යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති හෙයින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කර මත 2008.10.21 වැනි දිනට නිවාස ණය දෙක මත මුළු හිඟ මුදල වශයෙන් රුපියල් දාහත් ලක්ෂ හැටඅටදහස් හයසිය තිස්තුනකුත් ශත හතලිස් හයක මුදලක් (රු. 17,68,633.46) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද ,

ඉහත කී රුපියල් දාහත්ලක්ෂ හැටඅටදහස් හයසියතිස් තුනකුත් ශත හතලිස්හයක මුදල (රු. 17,68,633.46) සහ පළමුවන නිවාස ණය මත ගෙවිය යුතු මුදල් වශයෙන් රුපියල් දසලක්ෂ අසූතුන්දහස් තුන්සිය පනස්අටකුත් ශත හැටහයක මුදල (රු. 10,83,358.66) මත 2008.10.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27% බැගින් තවදුරටත් පොළිය ද දෙවන නිවාස ණය මත ගෙවිය යුතු මුල් මුදල වශයෙන් රුපියල් හාරලක්ෂ අනූහයදහස් පනස් නවයකුත් ශත හැටහතරක මුදල (රු. 4,96,059.64) මත 2008.10.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19.68% බැගින් තවදුරටත් පොළිය ද, තවද සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, ඔලබොදුව පිහිටි නානාබිගේවත්ත සහ අඹගහවත්ත (නමුත් පිඹුරේ නානාබිගේවත්ත සහ අඹගහවත්ත වශයෙන් විස්තර කරන ලද) ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් මැන සාදන ලද අංක 2600 සහ 2004 මැයි මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් C නමැති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් A, D (මීටර් 4.5ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ B ද, නැගෙනහිරට : ලොට් B ද, දකුණට : මාරාගහවත්ත හෙවත් මාරාගහලන්ද ද, බස්නාහිරට : අංක 892 දරන පිඹුරේ ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2600 දරන පිඹුර අනුව රූඩ් එකකුත්, පර්චස් දහඅටක (අ. 0, රූ. 1, පර්. 18) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය. මෙය හොරණ දිසා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 238/150 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී අංක 2600 දරන පිඹුරේ නිරූපිත ලොට් D මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් ඊට සමාන අනුබද්ධ අයිතිවාසිකම් ද ලොට් D සිට ගෝනපොල ඔලබෝදුව පාර දක්වා දිවෙන පාර සඳහා වෙන් කිරීම ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

02-505/1

---

### නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජීවනී කල්පනා මුණවීර ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 787 සහ 2005 ඔක්තෝබර් මස 03 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කෑගල්ල, නෙලුම්දෙණිය, ඉහළගම, "ගල්කොටුව" පදිංචි මානන්නලාගේ ශාන්ත විජේසිංහ යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති හෙයින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.10.27 වැනි දිනට රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පන්සිය විසිහයකුත් ශත අනූනවයක මුදලක් (රු. 2,45,526.99) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පන්සිය විසිහයකුත් ශත අනූනවයක මුදලක් (රු. 2,45,526.99) සහ 2008.10.27 වැනි දිනට නිවාස ණය මත ගෙවිය යුතු මුල් මුදල වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදාහක මුදල (රු. 1,76,000) මත 2008.10.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, වේවැල්දෙණිය පහළගම පිහිටි කොහොඹගහවත්ත, දෙල්ගහවත්ත සහ ගලබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 1513 සහ 2004 මැයි මස 02 දිනැති පිඹුර ප්‍රකාර ලොට් 5 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 6 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් ආර් 1 ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : මෙම පිඹුරේ කුඹුර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1513 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) හෙවත් හෙක්ටයාර් 0.0253ක විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදිය සෑම සියළු දේද සමග ය. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එප් 289/39 දරන වෙළුමේ/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 1513 දරන පිඹුරේ නිරූපිත ලොට් ආර්1 සහ ආර්6 දරන ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

02-505/2

මුද්‍රණය හා බෙදාහැරීම සීමාසහිත ශ්‍රී ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk